**කහවත්ත ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 21 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,778,927 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ | වත්කම් බැරකම් ප්‍රකාශයේ පවතින තොරතුරු පමණක් ඇත. |

### 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)ඇ | 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අවස්ථා 06 කදී ලබාදී තිබුණු එකතුව රු. 65,652 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | මුදල් ගෙවන ලෙස ලිපි මඟින් දැනුවත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 07 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි ඉන්ධන දහන පරීක්ෂාව සිදුකල යුතුවේ. | ඉන්ධන දහනයට අදාලවන සුළු අළුත්වැඩියාවන් නිමකර ගැනීමෙන් පසු ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,077,670 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,817,312 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,370,450 | 3,556,133 | 3,431,231 | 1,625,484 | 3,371,486 | 3,480,614 | 4,095,870 | 1,633,246 |
| (ii) | කුලී | 8,186,805 | 6,231,484 | 6,124,980 | 794,419 | 8,003,826 | 5,552,976 | 5,521,526 | 686,519 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 932,450 | 1,154,617 | 1,148,867 | - | 475,130 | 919,367 | 925,867 | - |
| (iv) | වෙනත් ආදායම් | 9,766,550 | 8,537,062 | 11,805,659 | 11,318,903 | 8,853,754 | 9,621,437 | 5,569,757 | 15,071,950 |

#### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) (i) | වරිපනම් බදු අය කිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කල යුතු වුවද, 2009 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කර නොතිබුණි. | වසර 05 කට වරක් දේපල තක්සේරු කල යුතුවේ. | වරිපනම් ප්‍රතිශෝධනය සඳහා මෙම වර්ෂයේ අප්‍රේල් මස තක්සේරු නිලධාරීන් පැමිණෙන බව දන්වා ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 677 ක රු. 1,519,901 ක හිඟයක් පැවතුණු අතර, එයට වර්ෂ 05 ට වැඩි කාලයක් හිඟව පවතින ඒකක 104 කට | හිඟ ආදායම් රැස්කිරීමට විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කල යුතුවේ. | ඉදිරියේ දී ජංගම සේවා වැඩසටහන් පවත්වා හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | අදාල රු. 333,100 ක් ඇතුලත් වී තිබුණි.<br><br>එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වසර 05 ට වඩා වැඩි කාලයක් හිඟව පවතින එකතුව රු. 56,745 ක අක්කර බදු අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් රැස්කිරීමට විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කල යුතුවේ. | අක්කර බදු සතොක්ෂණයක් සිදුකර ආදායම් රැස්කිරීමට වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතී. |

**2.2.3 කුලී**

----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------------- |
| | සමාලෝචිත වර්ෂයට අදාලව කඩකාමර කුලී රු. 76,100 ක් හා කහවත්ත සතිපොලේ මාළු ලැල්ලෙන් රු. 144,000 ක් අයවිය යුතුව පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා නීති මඟින් කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | -------------------------------------- |
| (අ) | වාර්ෂික වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට අදාල ආයතන දැනුවත් කර තිබුණද, බලපත්‍ර ලබා නොගත් ආයතන වලට එරෙහිව සභාව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම වෙළඳ ආයතන 14 ක් බලපත්‍ර ලබාගෙන නොතිබීම හේතුවෙන් රු. 12,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | නියමිත කාල රාමුවක් තුල වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල යුතුවේ. | බලපත්‍ර ලබා නොගත් වෙළඳ ආයතන පිළිබඳව ආදායම් පරිපාලක මහත්මියගෙන් හා අනෙක් නිලධාරී මහතාගෙන් වාර්තාවන් කැඳවා ඇත. |
| (ආ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව බලපත්‍ර ලබාගත යුතු ආයතන 26 ක් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණු නමුත් සභාව ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එම හේතුවෙන් සභාවට රු. 114,400 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීමද ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි. | අදාල පනත් හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළුම ආයතන වෙත බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල යුතුවේ. | මෙම බලපත්‍ර ලබා දීමට නොහැකි වූයේ 2018 වර්ෂය තුල ආයතනයේ නිලධාරීන් දෙදෙනෙක් විශ්‍රාම යාම, තවත් නිලධාරීන් දෙදෙනෙකු ප්‍රසූත නිවාඩු ලබා යාම සහ පරිසර විෂයය භාර නිලධාරියා පාසලක ගුරු සේවය සඳහා යාම නිසාවෙන් සිටින කාර්යය මණ්ඩලයට ඉටුකල යුතු රාජකාරී කටයුතු අධික වීම හේතුවෙනි. |

**2.2.5 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත දැන්වීම් පුවරු ආදායමින් රු. 357,006 ක් හා ඉකුත් වර්ෂයට අදාලව දැන්වීම් පුවරු 149 න් රු. 606,800 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ලිපි මඟින් දැනුවත් කිරීම් කර ඇති අතර ඉදිරියේ දී නිවැරදි සමීක්ෂණයක් සිදු කර අදාල ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වූ උසාවි දඩ රු. 5,815,777 ක් විය. 2016 වර්ෂයට අදාලව ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු රු. 5,949,903 ක් ලෙස හඳුනාගෙන තිබුණද, 2017 හා 2018 වර්ෂ සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කරගෙන හිඟ ආදායම් ලබා ගැනීමට කටයුතු කල යුතුවේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිබඳ උපලේඛන අදාල ආයතනය විසින් ලබා නොදීම හේතුවෙන් හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිබඳ අගයන් දැනගැනීමට අපහසු වී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ප්‍රතිපාදන ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල භෞතික සැලසුම් හා මංමාවත් සංවර්ධනය හා සුභසාධන සේවා වෙනුවෙන් පිළිවෙලින් රු. | අයවැයගත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අයවැයගත ප්‍රාග්ධන | මූලධන අධාර වැඩි ප්‍රමාණයක් නොලැබීම හේතුවෙන් වෙන් කර ඇති |

| | | |
|---|---|---|
| 14,875,000 ක් හා රු. 7,655,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඒ සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු. 8,623,370 ක් හා රු. 400,898 ක් පමණක් විය. ඒ අනුව ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 60 ක් හෙවත් එකතුව රු.13,505,732 ක් උපයෝජනය කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ප්‍රතිපාදන සඳහා මුදල් රැස්කර ගැනීමට සභාව කටයුතු කල යුතුවේ. | ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනයට ගැනීමට නොහැකි වී ඇත. සභා අරමුදල් මඟින් ව්‍යාපෘති ගණනාවක් මේ වන විට සිදු කර ඇත. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, වර්තමානයේ කසළ බැහැර කරනු ලබන භූමිය සභාවට පවරා ගැනීමටද අපොහොසත් වී තිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුවේ. | සභාව මඟින් කසළ බැහැර කරන ඉඩම් කොටස සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, ඉඩම පවරා ගැනීමෙන් පසු විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කර ඇත. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සකස් කර නොතිබුණි. | අදාල සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේ දී සැලසුම් සකස් කිරීමට කටයුතු කරමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුර අනුමත වූ දින සිට පුරප්පාඩුව පවතින ආදායම් පරීක්ෂක තනතුරට සමාලෝචිත වර්ෂය අවසන් | පුරප්පාඩු වූ තනතුරු සඳහා සුදුසු නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කල යුතුවේ. | කාර්ය මණ්ඩල තොරතුරු කාර්තු වශයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කරනු ලබන අතර, අවසාන කාර්ය මණ්ඩල කාර්තු වාර්තාව 2019 මාර්තු 31 දිනට යොමු කර |

| | | |
|---|---|---|
| වනවිටද නිලධාරියෙකු පත්කර නොතිබීම හේතුවෙන් සභාවේ ආදායම් රැස්කිරීම දුර්වල මට්ටමක පැවතුණි. | | ඇත. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවතින අනවසර ඉදිකිරීම් හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට හෝ නියමානුකූල කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම, ඒවා ඉවත් කිරීම හෝ නියමානුකූල කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුවේ. | අප සභාව සතුව එක් කාර්මික නිලධාරියෙකු පමණක් සේවය කරන බැවින් බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් නියමානුකූලව හඳුනා ගැනීමේ ගැටළුවක්ව පවතී. එසේ වුවද මේ වන විට හඳුනාගෙන ඇති අනවසර ඉදිකිරීම් මෑත කාලයේ ඉදි නොකල ඒවා වන අතර ඉදිරියේ දී නව ඉදිකිරීම් හඳුනාගෙන ඒවා නීත්‍යානුකූල කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමි. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. 96,421,105 ක් වූ ජංගම නොවන වත්කම් සභාව සතුව පැවතියද ඊට අදාල වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේ දී සමීක්ෂණයක් සිදුකර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර විස්තරාත්මක උප ලේඛන සකස් කිරීමට කටයුතු කරමි. |

#### 3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ අනතුරට ලක්ව අළුත්වැඩියා කිරීම සඳහා රු. 73,175 ක් අත්තිකාරම් ගෙවා 2017 වර්ෂයේ ගරාජයක් වෙත භාරදී තිබුණු ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අළුත්වැඩියා කර නොතිබුණි. එම රථය අනාරක්ෂිතව ගරාජය තුල තිබෙන බව 2018 දෙසැම්බර් 31 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වාහන නඩත්තු හා අළුත්වැඩියා කටයුතු අප්‍රමාදව සිදුකල යුතුවේ. | ට්‍රැක්ටර් රථය සඳහා අවශ්‍ය අමතර කොටස් වෙළඳපලෙහි සොයා ගැනීම අපහසුවීම නිසා එහි අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇති අතර මේ වන විට එම අමතර කොටස් සපයාගෙන අළුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සුදුසු අළුත්වැඩියාවකින් පසු ප්‍රයෝජනයට ගත හැකි බවට කහවත්ත ඩිපෝ ඉංජිනේරු විසින් නිර්දේශ කර තිබූ පිරිවැය රු. 1,300,000 ක් වූ ඩබල් ඩ්‍රම් වෛබ්‍රේටර් රෝල 2013 වර්ෂයේ සිට අළුත්වැඩියා කිරීමකින් තොරව සහා භූමියේ තිබුණි. | අළුත්වැඩියා කිරීමට හෝ විධිමත් පරිදි වෙන්දේසි කිරීමට කටයුතු කල යුතුවේ. | ඩබල් ඩ්‍රම් වෛබ්‍රේටර් රෝල වෙන්දේසි කිරීම සුදුසු බවට භාණ්ඩ සමීක්ෂණය මඟින් නිර්දේශ කරනු ලදුව වෙන්දේසි කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. |
| (ඇ) | අළුත්වැඩියා පිරිවැය අධික වීම හේතුවෙන් වසර 03 කට පමණ පෙර ධාවනයෙන් ඉවත් කර තිබූ ට්‍රැක්ටරයක් හා 2015 වර්ෂයේදී හා ඊට පෙර සිට ගර්හිත කර ඇති කැබ් රථයක් හා ට්‍රේලරයක් විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන නඩත්තු හා අළුත්වැඩියා කටයුතු අප්‍රමාදව සිදුකල යුතු අතර, ගර්හිත වාහන විධිමත්ව අපහරණය කල යුතුවේ. | කැබ්රථය හා ට්‍රැක්ටර් රථයක් වෙන්දේසි කිරීම සුදුසු බවට භාණ්ඩ සමීක්ෂණය මඟින් නිර්දේශ කරනු ලදුව වෙන්දේසි කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. අනෙක් ට්‍රැක්ටර් රථය සභාවේ මූල්‍ය තත්ත්වය යහපත් වූ විට අළුත්වැඩියා කිරීමට අපේක්ෂා කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

---------------

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 2,238,371 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරියේ දී පිළියෙල කරමි. |

**3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හල්දොල මාර්ගයේ විනාශ වී ගිය පැති බැම්ම මීටර් 06 ක් දිගට ඉදිකිරීම සඳහා රු. 199,609 ක් වැයකර තිබුණු නමුත් එය ඉදිකර ඇති දුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පුරවා තිබූ පස් මාර්ගය අසල ඇලට සේදී යමින් පැවතුණි. | සංවර්ධන ව්‍යාපෘති විධිමත් පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුවේ. | ඉහත ස්ථානයේ පැවැති පැරණි ගල් බැම්ම කඩා වැටීම හේතුවෙන් මාර්ගය ගිලා බැසීම නිසා මාර්ගයේ වාහන ධාවනය කළ නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. එම හදිසි අවශ්‍යතාවය මත වාහන ධාවනය කල හැකි වන පරිදි ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ ඉහත පැති බැම්ම සකස් කරන ලදී. දැනට මාර්ගයේ වාහන ධාවනය වන අතර මෙම වර්ෂයේ දී එහි ඉතිරි කොටස නිම කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට සභාවට යෝජනා කර |

ඇත.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

### 4.1 අයවැය පාලනය
-------------------

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------ |
| (අ) | වැය විෂයයන් 26 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 759,233 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කර, වෙන් කරන ලද ප්‍රතිපාදන ද ඵලදායී ලෙස උපයෝජනය කල යුතුවේ. | වියදම් දැරීමට සිදු වේ යැයි අපේක්ෂාවෙන් එම වැය ශීර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. |
| (ආ) | වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 16,628,500 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 80 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කර, වෙන් කරන ලද ප්‍රතිපාදන ද ඵලදායී ලෙස උපයෝජනය කල යුතුවේ. | වියදම් දැරීමට සිදු වේ යැයි අපේක්ෂාවෙන් එම වැය ශීර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ----------------------------- |
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කල යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇති අතර ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |